NJP
නව ජනතා පෙරමුණ
புதிய மக்கள் முன்னணி
New People's Front
No. 157/C
Dehiwala Road,Maharagama, Sri Lanka.
+94 76 702 4945 / +94 74 056 0595/ +94 11 222 3606
+94 11 222 3606
njpofficesrilanka@gmail.com
New People's Front

2026 මාර්තු මස 08 වන දින

අතිගරු ජනාධිපතිතුමා,
ජනාධිපති ලේකම් කාර්යාලය,
ගාලු මුවදොර,
කොළඹ 01.

අතිගරු ජනාධිපතිතුමනි,

**කාන්තා අපගේ අයතීන් හා සවිබල ගැන්වීම් සම්බන්ධව**

කාන්තා අයිතීන් සහ කාන්තා සවිබල ගැන්වීම සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කරමින් බලයට පැමිණි මාලිමා ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශය මගින් කාරණා විශාල වශයෙන් සාකච්ඡා වුවද මේ වනවිට අපට කිසිදු සහනශිලි ක්‍රියාපිලිවෙතක් ඇති කර නොමැත. එම ප්‍රකාශයේ සඳහන් කාරණා පිළිබඳ අවධානය යොමු කරමින් පහතින් සඳහන් කරුණු ඉදිරිපත් කල හැකිය.

01) ස්වයං රැකියා සහ සුළු පරිමාණ ව්‍යාපාරවල නිරත කාන්තාවන් සඳහා සහනදායී ණය ක්‍රම සහ තාක්ෂණික උපදේශන ලබාදීම.

02) ග්‍රාමීය කාන්තාවන් පීඩාවට පත් කර ඇති අසාධාරණ ක්ෂුද්‍ර මූල්‍ය ණය උගුලෙන් ඔවුන් මුදාගැනීම සඳහා සහනදායී වැඩපිළිවෙලක් සැකසීම.

03) කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමේ නීති දැඩි කිරීම සහ නඩු කටයුතු කඩිනම් කිරීම.

04) කාන්තාවන්ගේ සෞඛ්‍ය පහසුකම් නංවාලීම සහ සනීපාරක්ෂක ද්‍රව්‍ය සඳහා පවතින අධික බදු ඉවත් කර ඒවා සහන මිලට ලබාදීමට පියවර ගැනීම.

05) රැකියාවල නිරත මව්වරුන්ට සහනයක් ලෙස රජයේ සහ පෞද්ගලික අංශය තුළ ප්‍රමිතියෙන් යුත් ළමා සුරැකුම් මධ්‍යස්ථාන (Daycare Centers) ස්ථාපිත කිරීම දිරිමත් කිරීම.

06) වතු ක්ෂේත්‍රයේ සහ මැදපෙරදිග රැකියාවල නිරත කාන්තාවන්ගේ අයිතිවාසිකම් සහ සුරක්ෂිතභාවය තහවුරු කිරීමට විශේෂ වැඩපිළිවෙලවල් ක්‍රියාත්මක කිරීම.

ශ්‍රී ලංකාවේ සාමාන්‍ය පවුලක "මුළුතැන්ගෙය පවත්වාගෙන යාම" හෙවත් පවුලේ පෝෂණය සහ ආහාර සුරක්ෂිතතාව සහතික කිරීමේ ප්‍රධාන වගකීම පැවරී ඇත්තේ කාන්තාවටයි. වර්තමාන ආර්ථික අර්බුදය හමුවේ අපට විශාල ගැටළු කිහිපයකට මුහුණ දීමට සිදු වී ඇත.

- ඉහළ යන ජීවන වියදම සහ උද්ධමනය හමුවේ ආහාර ද්‍රව්‍යවල මිල අධික ලෙස ඉහළ යාම නිසා කාන්තාවන් දැඩි පීඩනයකට පත්ව සිටියි. ස්ථාවර ආදායමක් ලබන පවුල්වල පවා වැටුප් වැඩි නොවන අතරතුර, සහල්, පරිප්පු, එළවළු සහ පොල් වැනි අත්‍යවශ්‍ය ද්‍රව්‍යවල මිල දෙගුණයකින් හෝ තෙගුණයකින් ඉහළ ගොස් ඇත. සීමිත මුදලකින් මුළු පවුලටම වේල් තුනම පිරිමසා ගන්නේ කෙසේද යන්න දිනපතා ඇයට ඇති විශාලතම මානසික පීඩනයයි.

- පෝෂණ ගුණය පවත්වා ගැනීමේ අර්බුදය, මුදල් හිඟකම නිසා කාන්තාවන්ට සිදු වී ඇත්තේ තම ආහාර වේලෙහි ගුණාත්මකභාවය කැප කිරීමටයි.

  මස්, මාළු, බිත්තර සහ කිරිපිටි වැනි ද්‍රව්‍යවල මිල ඉහළ යාම නිසා ඒවා ආහාර වේලෙන් ඉවත් කිරීමට හෝ සීමා කිරීමට සිදු වී ඇත.
  බොහෝ නිවෙස්වල පවතින සිරිතක් වන්නේ ඉතිරි වන ආහාරය හෝ අඩුම ආහාර ප්‍රමාණය මව (කාන්තාව) විසින් ලබා ගැනීමයි. මෙලෙස පවුලේ අනෙක් සාමාජිකයන් පෝෂණය කිරීමට ගොස් කාන්තාවන් රක්තහීනතාවය වැනි රෝගී තත්ත්වයන්ට ගොදුරු වී ඇත.

- බලශක්ති පිරිවැය - මුළුතැන්ගෙය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය බලශක්තිය සපයා ගැනීම තවත් බරපතල ගැටලුවකි. ගෑස් මිල ඉහළ යාම නිසා බොහෝ නාගරික හා අර්ධ නාගරික කාන්තාවන්ට නැවතත් දර ලිප භාවිතා කිරීමට සිදු වී ඇත. මෙය ඇයගේ කාලය මෙන්ම සෞඛ්‍යය (දුම නිසා ඇතිවන රෝග) කෙරෙහිද බලපායි

- කාලය පිළිබඳ දරිද්‍රතාවය (Time Poverty) ආර්ථික අපහසුතා නිසා බොහෝ කාන්තාවන් අතිරේක ආදායම් මාර්ග සොයා ගැනීමට පෙළඹී ඇත.

  නිවසේ වැඩ කටයුතු (මුළුතැන්ගෙය පාලනය) කරන අතරතුරම, පිටත රැකියාවක නිරත වීමට සිදුවීම නිසා ඇය දැඩි ශාරීරික සහ මානසික වෙහෙසකට පත් වේ.පිරිවැය අඩු කර ගැනීමට වෙළඳපොළවල් කිහිපයක ඇවිද අඩු මිලට බඩු සෙවීම වැනි කටයුතු සඳහා ඇයට අමතර කාලයක් වැය කිරීමට සිදු වේ.

- ක්ෂුද්‍ර මූල්‍ය සහ අනෙකුත් ණය බර මුළුතැන්ගෙය පවත්වාගෙන යාමට අවශ්‍ය එදිනෙදා වියදම් පියවා ගැනීමට බොහෝ ග්‍රාමීය කාන්තාවන් ක්ෂුද්‍ර මූල්‍ය ණය හෝ "පොළියට මුදල් ගැනීම" වැනි අහිතකර මූල්‍ය ක්‍රමවලට යොමු වී ඇත. මෙය අවසානයේදී ඇයව විශාල ණය උගුලක සිර කරයි.

- වත්මන් ආණ්ඩුව බලයට පත්වීමට පෙර දේශපලන වේදිකාවේ දැවැන්ත ලෙස ඉස්මතු කළ කාරණයකි බදු බර ජනතාවට දරාගැනීමට නොහැකි බව. එයිනුත් වඩාත්ම ඉහලින් සඳහන් කළ විශේෂ කරුණක් වූවේ ඖෂධ හා පාසල් උපකරණ සඳහා පනවා ඇති බදු ඉතා අසාධාරණ බවයි. බලයට පත් වූ වහා එම බදු බිංදුවට ගෙන එන බව පුන පුනා පවසන ලදී. එහෙත් මේ දක්වා එවැනි කිසිඳු දෙයක් මේ රජයෙන් ඉටු වී නැත. ඒවා අද වනවිට හුදු තවතෙක දේශපාලන බොරුවක් බවට පත්වී ඇත.

ලංකාවේ කාන්තාව අද වන විට මුළුතැන්ගෙය තුළ "ආර්ථික කළමනාකාරිනියකගේ" භූමිකාව රඟපාන්නේ ඉතාම දුෂ්කර තත්ත්වයන් යටතේය. ඇය තම පෞද්ගලික සෞඛ්‍යය සහ සතුට කැප කරමින් පවුලේ කුසගින්න නිවීමට වෙහෙසෙයි.

මෙලෙස ඔබතුමන්ගෙන් ලෝක කාන්තා දිනය සමරණ අද දින නව ජනතා පෙරමුණ ලෙස අප විසින් ඉල්ලා සිටිනුයේ මුළුතැන්ගේ කළමනාකරණය කරමින් දරුවන්ගේ පෝෂණ ඌනතා සපුරමින් දැඩි කායික හා මානසික දුෂ්කරතාවයන්ට මුහුණ දෙමින් දෛනික ජීවිතය ගෙන යන කාන්තාවන්ට පොරොන්දු වූ පරිදි සහනදායි වැඩ පිළිවෙල ක්‍රියාත්මක කරන ලෙසය.

මෙයට

....................................
දීප්ති පෙරේරා
කාන්තා කටයුතු ලේකම්